# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
## வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
## Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය, කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo -01

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
**Ministry of Finance, Economic and Policy Development**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. – TIP/TP/01/10(107) | ඔබේ අංකය / உமது இல / Your No. – | දිනය / திகதி / Date – 13.12.2019 |

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මයාණි

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

ගරු මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා විසින් 2019 දෙසැම්බර් මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය **2019.12.13** දිනැති අංක 2153/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 525 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**සී. ජයසූරිය**
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 1. රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා

2. අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා


දුරකථන අංකය / தொலைபேசி / Telephone – 0112 484 888 | ෆැක්ස් / தொலைநகல / Fax – 0112 484 830 | විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail – admin@tipd.treasury.gov.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Website – www.treasury.gov.lk

# රජයේ නිවේදනයයි
## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත
## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2019 දෙසැම්බර් මස ..14.. වැනි දින සිට ආරම්භ වන දින 31 ක් වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ**
**මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති**
**සංවර්ධන අමාත්‍ය**

2019 දෙසැම්බර් මස ..13.. වන දින
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 11.01 | 1101.00.10 | තිරිඟු පිටි | කි. ග්‍රෑමයට රු. 8.00 |